# අලි පැටවු, අලි හා කොටි

මල්වතු අස්ගිරි මහානාහිමිවරුන්ට අලි පැටවුන් දෙදෙනකු පූජාකිරීම ඉමහත් කතාබහට ලක්විණි. ඒ කතාකළ අය අතර අලි පැටවුන් ගැන අනුකම්පාවක් දැක් වූ අයට අමතරව අලි අයිතිවාසිකම් ගැන කතා කළ අය ද වූහ. වෙනදා සිංහල විරෝධී ස්ථාවරයකින් මානව අයිතිවාසිකම් ගැන කතාකළ ඇතැමුනට මෙවර බෞද්ධ විරෝධීව අලි අයිතිවාසිකම් ගැන කතාකිරීමේ අවස්ථාව ද හිමිවිණි. ඇතැම්හු විනයවර්ධන සභාකාරයන් අනුගමනය කරමින් සියළු භික්ෂූන් වහන්සේ ආරණ්‍යගත කිරීමට ද යෝජනා කළහ. අලි පැටවුන් පූජාකිරීමෙන් පසුව ද ඔවුන්ට අලි අම්මලා සමග තව ටික කලක් අලි ගාලේ ම ඉන්නට ඉඩහැරියේ නම් මැනවි යැයි අපිදූ සිතමු. එහෙත් අලි අයිතිවාසිකම් ගැන කතාකළ මානවයන් එසේ කෙළේ කිනම් අරමුණකින් ද යන්න දැනගැනීමට අංජනම් එළි බැලිය යුතු නො වේ. අලින්ට කැලයේ ඉන්නට ඉඩ නොදී අලි ගාලක තබාගැනීම ම අලි අයිතිවාසිකම්වලට පහරක් නොවන්නේ ද? සත්වෝද්‍යාන ආදිය, සතුන් ද ඇතුළුව මුළු ලොව ම මවා ඇත්තේ මිනිසුන් සඳහා ය යන බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයේ ප්‍රතිඵල මිස සිංහල බෞද්ධ චින්තනයක් නිසා ඇති වූ ආයතන නො වේ. සතුන් කිහිපදෙනකු අල්ලා ගෙනවිත් මිනිසුන්ට ප්‍රදර්ශනය කිරීම සඳහා ගාල්කර තැබීම සත්ව අයිතිවාසිකම්වලට එකඟ ද? මිනිසුන් වෙනුවෙන් විශ්වවිද්‍යාලවල හා වෙනත් ආයතනවල සතුන් මරමින් ඊනියා පරීක්ෂණ පැවැත්වීම සත්ව අයිතිවාසිකම්වලට එකඟ ද? බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දාසයන්ට ඒ එකකවත් වරදක් නො පෙනෙයි. අලි අයිතිවාසිකම් ගැන කතාකරන්නවුන් කළ යුතුව තිබුණේ අලි අම්මලා ද සමගින් අලි පැටවුන් කැලයට ගොස් දැමීමට ඉල්ලීම ය. එපමණක් නොව පටියෙන් බැඳ ඇවිද්දවන බල්ලන්ගේ බලු අයිතිවාසිකම් ගැන ද සිත යොමුකිරීම ය. මේ අය  ප්‍රභාකරන් අම්මලාගෙන් පැහැරගෙන ගිය දරුවන්ගේ දරු අයිතිවාසිකම් ගැන කතාකෙළේ දැයි අපි නො දනිමු. එහෙත් මොවුන් දැනට ටික කලකට ඉහත පෙරහරේ ගෙන යන අලින්ගේ අලි අයිතිවාසිකම් ගැන සතිඅන්ත කසිකබල් පුවත්පතකට ලියූ බව අපි දනිමු. මොවුන්ට ඇත්තේ අලි කරුණාවක් නොව හැකිනම් පෙරහරට අලි නැතිකිරීමේ අවශ්‍යතාව ය. බැරිම නම් අඩුම තරමින් ශාසනයට පරිභවකිරීම ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බැළයන් වූ මොවුන්ට අවශ්‍ය කුමක් ද යන්න පැහැදිලි ය. දැන් මේ පඬියන් කියනු ඇත්තේ අප සැම කරුණාකදීම බටහිරට බැණ වදින බව ය. මෙරට ප්‍රශ්න බොහොමයකට ම මුල බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා එහි දාසයන් නම් ඒ බව සඳහන් නොකර සිටිය යුත්තේ බැළයන් හෙළිදරවු වීම වැළැක්වීමට ද? බැළයන්ට ඇත්තේ බැළ අයිවාසිකම් පමණකි.

අලි පැටවු ගැන ඇතැම් ඒ ජා ප නායකයෝ ද කතාකළහ. එහෙත් ඒ අලි කැලයට එළවීමට නො වේ. එසේ වුවත් ඌව වෙල්ලස්ස ජනතාව අලි කැලයට ම එළවූහ. මොණරාගල දිස්ත්‍රික්කයේ ඇතැම් ආසනවල සියයට විස්සක්වත් ඡන්ද ලබාගැනීමට නොහැකිවීමෙන් ඒ ජා පක්ෂය පෙන්නුම් කර ඇත්තේ ඔවුන් කෙතරම් සිංහලත්වයෙන් ඉවත් වී ඇත් ද යන්න ය. ජ වි පෙරමුණට ආණ්ඩුවේ ඊනියා ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියා ගැන කතාකර තම පරාජය වසංකළ හැකි නො වෙයි. ජාතිකත්වය හා මාක්ස්වාදය අතර දෝලනය වන ජ වි පෙ අද මාක්ස්වාදය දෙසට ඇදෙමින් ඇත. ජ වි පෙ දේශපාලනයේ තවදුරටත් නන්නත්තාර නොවීමට නම් නැවතත් ජාතිකත්වය දෙසට නැඹුරුවිය යුතු ය. එය හුදෙක් ආණ්ඩුව විවේචනය කිරීමට නොව ආණ්ඩුව වැරදි මාවතක ගමන් කරන්නේ නම් ඒ නිවැරදිකර ජාතිකත්වයේ බලවේග ශක්තිමත් කිරීමට විය යුතු ය. එසේ නොකළහොත් ජ වි පෙරමුණ ඒ ජා පක්ෂයේ වලිගය බවට පත්වනු ඇත. ඇතැමුන් ඒ දකින්නේ අලි වලිගයේ සීනුව ගැටගැසීමක් ලෙස ය. එහෙත් මේ සියල්ලෙන් ආණ්ඩුව හිස උදම්මාගත යුතු නො වේ. ආණ්ඩුවක් ජනතාව විසින් ප්‍රතික්ෂෙප කරනු ලැබීමට එතරම් කාලයක් ගත නො වේ. ආණ්ඩුවේ ජනප්‍රියබව උපයෝගී කරගෙන පරණ බලය බෙදීමේ තැටිය නැවත වාදනය කිරීමට ආණ්ඩුවේ සිංහල බෞද්ධ විරෝධීන්ට අවශ්‍ය වී ඇත. ආණ්ඩුව ජනප්‍රිය වූයේ ඒ සිංහල බෞද්ධ විරෝධීන්ගේ ප්‍රතිපත්ති අනුගමනය කිරීම නිසා නොව ඒ ප්‍රතිපත්තිවලට විරුද්ධව ක්‍රියාකළ බැවිනි. ආණ්ඩුවේ හා ඉන් පිටත සිටින සිංහල බෞද්ධ විරෝධීන් සැමදාමත් කීවේ ප්‍රභාකරන් සමග සාකච්ඡා කරන ලෙස ය. එසේ සාකච්ඡා කරමින් සිටියේ නම් ආණ්ඩුව මේ වන විට මැතිවරණවලින් පරාජයවීම ආරම්භවීමට තිබුණි. ආණ්ඩුවේ ජනප්‍රියබවට හේතුව ස්ථිරසාරව බටහිරයන්ට හා ඔවුන්ගේ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබූ දෙමළ ජාතිවාදයට අවනත නොවී කොන්ද කෙළින් තබාගෙන ක්‍රියා කිරීම ය. ඌව වෙල්ලස්සේ ආණ්ඩුව ලැබූ ඡන්දවලින් කීයෙන් කීයක් සන්ධානයේ කසිකබල් මාක්ස්වාදී පක්ෂ නිසා ආණ්ඩුවට ලැබිණි ද? ඒ පක්ෂවලින් අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමෙන් ආණ්ඩුවේ ජයග්‍රහණයට රුකුලක් වූවා නො වේ. ජඩමාධ්‍ය නොවන්නට මේ කසිකබලුන් ඉන්නවා ද නැත් ද යන්නවත් අපි නො දනිමු.

© Prof. Nalin De Silva

දේශපාලන පක්ෂයකට සිංහල ජාතිකත්ව ප්‍රතිපත්තියක පිහිටා කටයුතුකිරීමෙන් අනුපාත ක්‍රමය යටතේ වුවත් තුනෙන් දෙකක ඡන්දයක් ගතහැකි බව අපි බොහෝ කලකට පෙර පෙන්වා දුනිමු. එහිදී අවශ්‍ය වනුයේ සිංහලයන්ගේ ඡන්දවලින් සියයට අසූපහක් පමණ ලබාගැනීම ය. අද ඒ මට්ටමට සන්ධානය පැමිණ ඇත. ඒ අතර සන්ධානයට දෙමළ ඡන්ද හා මුස්ලිම් ඡන්ද ද යම් ප්‍රමාණයක් ලැබෙයි. විශේෂයෙන් ම කඳුකරයේ හා නැගෙනහිර දෙමළ ඡන්ද අද සන්ධානයට යම් පමණකින් හෝ ලැබෙයි. මේ ප්‍රතිපත්ති දිගටම ගෙන යන්නේ නම් සන්ධානයට මහාමැතිවරණයෙන් හා ජනාධිපතිවරණයෙන් ද තුනෙන් දෙකක ජයග්‍රහණයක් ලබාගත හැකි ය. එහෙත් අවධාරණය කළ යුත්තක් වෙයි. එනම් මේ ප්‍රතිපත්ති දිගට ම ගෙන යෑම ය. අලි පැටවුන්ගේ, කොටි පැටවුන්ගේ, බටහිරයන්ගේ, ඉන්දියාවේ කෞටිල්‍ය පැටවුන්ගේ හා සිංහල බෞද්ධ විරෝධී පඬියන්ගේ අවශ්‍යතාව සඳහා දහතුන ධන (බණ නොවේ. පසුගිය සතියේ ලිපියෙහි මුද්‍රණ දෝෂයකින් ධන යන්න බණ ලෙස සඳහන් වී තිබිණි.) ක්‍රියාත්මක කරන්නේ නම් සන්ධානයට ඡන්ද විශාල සංඛ්‍යාවක් නැතිවීම වැළැක්විය හැකි නො වේ.

මෙතෙක් පවත්වා ඇති මැතිවරණවලින් පෙනී යන්නේ සිංහලයන්ගෙන් අති විශාල බහුතරයක් ද, නැගෙනහිර හා කඳුකරයේ දෙමළ ජනයාගෙන් යම් ප්‍රමාණයක් ද සංධානයට ඡන්දය දෙන බව ය. එහෙත් උතුරු පළාතේ කියැවෙන්නේ වෙනම ම කතාවකි. යාපනය හා වවුනියාව පළාත් පාලන ඡන්දවලින් සංධානය පරාජය වී ඇත. යාපනයේ මහා නගර සභාව දිනාගත්තේ සංධානය නොවේ දැයි කිසිවකු ප්‍රශ්නකරනු ඇත. එහෙත් එහි ඡන්දය දී ඇත්තේ සුළු පිරිසකි. ඉන් කරුණු දෙකක් කිවහැකි වෙයි. යාපනයේ ලියා පදිංචි වී ඇති ඡන්දදායකයන් සියයට පනහකට වැඩි පිරිසක් අද එහි නැත. එක්කෝ ඔවුන් මියගොස් ය. නැත්නම් විදේශගත වී ඇත. එසේත් නැත්නම් කොළඹට හා වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වී ඇත. ඒ කුමක් වුවත් ඉක්මනින් ම මුළු රටේ ම සංගණනයක් පැවැත්වීම අවශ්‍ය වෙයි. අද රට සමස්තයක් ලෙස ගත්කල ද උතුරු පළාත පමණක් ලෙස ගත්කල ද යාපන දෙමළ ජනයාගේ විශාල අඩුවීමක් පෙන්නුම් කෙරේ. දෙවැනි කරුණ නම් උතුරේ තවමත් කොටි දේශපාලනය පැරදී නැති බව ය. වවුනියාවේ සංධානය පැමිණියේ තුන්වැනි තැනට ය. එහි ජයගත්තේ කොටි වෙනුවෙන් පෙනී සිටි දෙමළ ජාතික සංධානය ය. ඔවුන් මෙවර තරග කෙළේ චෙල්වනායගම් ගේ මුල් පක්ෂය වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය නමිනි. යාපනයේ ඡන්දය නොදුන් බොහෝ අය ද දෙමළ රාජ්‍ය පක්ෂයට හිතවත් අය යැයි සිතිය හැකි ය. ඔවුන් ඩග්ලස් දේවානන්දගේ ආධිපත්‍යය හේතුවෙන් ඡන්දපොළට යෑමෙන් වළකින්නට ඇතැයි සිතිය හැකි ය. නැගෙනහිර පළාතේ දෙමළ ජනයාට බලය බෙදීමක් අවශ්‍ය නො වේ. කරුණා අම්මාන් ආදීන්ගේ දේශපාලනය හේතුවෙන් ඒ පළාතේ බලය බෙදීම යන්න අර්ථ ශූන්‍ය සංකල්පයක් බවට පත් වී ඇත. කඳුකරයේ දෙමළ ජනයා ද ඒ ස්ථාවරයට පැමිණෙමින් සිටිති. ඒ උතුර විසින් මෙහෙයවුණු වෙල්ලාල ආධිපත්‍යයෙහි හා චෙල්වනායගම්ගේ බෙදුම්වාදී දේශපාලනයෙහි පරාජයකි. චෙල්වනායගම්ට අවශ්‍ය වූයේ නැගෙනහිර හා කඳුකරය වෙල්ලාල දේශපාලනයට යටත්කර ඔවුන් ද හවුල් කරගනිමින් වෙන ම දෙමළ රාජ්‍යයක් පිහිටුවීමට ය.

එහෙත් උතුර තවමත් චෙල්වනායගම්ගේ වෙනම රාජ්‍ය දේශපාලනය අත්හැර නැත. එයට ප්‍රධාන හේතුව ඩග්ලස් දේවානන්දගේ මාක්ස්වාදී දේශපාලනය ය. කිසිකබල් මාක්ස්වාදය උතුරේවත් දකුණේවත් ජාතිකත්වයට හෝ ජාතිවාදයට හෝ විකල්පයක් නො වේ. උතුරු පළාතේ ජනතාව දෙමළ ජාතිවාදයෙන් මුදාගැනීමට තරමක කාලයක් ගතවනු ඇත. දේවානන්දට ඒ කළ නොහැක්කේ ඔහු ද අවසාන වශයෙන් ගත්කල ඊනියා බලය බෙදීමේ දේශපාලනයේ යෙදී සිටින බැවිනි. බලය බෙදීම යන්න බලය බෙදීමට හා බෙදුම්වාදයට පිළියමක් නො වේ. දේවානන්ද කළ එකම දෙය වූයේ ඒ ඒ ආණ්ඩුවල පිහිටෙන් කොටින්ගෙන් මැරුම් නොකා සිටීම පමණකි. රාජ්‍ය බලය නොමැති වන්නට කොටි ඔහු මරාදමා බොහෝ කල් ය. උතුරු වසන්තයට අමතර ව උතුරට බලය බෙදීමක් ගැන කතානොකරන නායකයකු අවශ්‍ය වෙයි. දෙමළ ජාතිවාදීන් විසින් යාපන වයිපව මාලෙයි ලියූ දවසේ සිට වපුරන ලද බොරු ඉතිහාසය හෙළිදරව් කරමින්, පළල් කරන ලද සිංහල ජාතියකට දෙමළ ජනයා එකතුකරගන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරක් සොයන නායකයකු උතුරට අවශ්‍ය වෙයි. කොටි හමුදාමය වශයෙන් උතුරේ පරාජය වුවත් දේශපාලනමය වශයෙන් පරාජය නොවීම ගැන දේවානන්ද ද වගකිවයුතු වෙයි. බලය බෙදීමෙන් හෝ බලය බෙදීමට ආවැඩීමෙන් හෝ කිසි දිනෙක දෙමළ ජාතිවාදී දේශපාලනය පරාජය කළ නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva